# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2477/22 - 2026 පෙබරවාරි මස 24 වැනි අඟහරුවාදා - 2026.02.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

5 වැනි වගන්තිය යටතේ නියෝගය

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙම නියෝගය මගින්, 2022 වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනැති අංක 2312/73 දරන *අතිවිශෙෂ ගැසට් නිවේදනය* මගින් අවසන් වරට සංශෝධිත 2006 වසරේ ඔක්තෝබර් මස 05 වැනි දිනැති අංක 1465/20 දරන *අතිවිශෙෂ ගැසට් නිවේදනය* මඟින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය ඉහත වගන්තිය යටතේ සංශෝධනය කරනු ලබන එහි උපලේඛනයේ 37 වන අයිතමයට වහාම පහත සඳහන් නව අයිතමය එකතු කරමි.

"38. ස්වභාවික ආපදාවකින් බලපෑමට ලක් වූ යම් පුද්ගලයකුට රජය මඟින් කරනු ලබන ගෙවීම් සඳහා දෙනු ලබන යම් රිසිට්පතක්."

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 02 - 0207

1A - PG 7547 — 403 (2026/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*